" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/01 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.02. 15 |
|---|---|---|---|---|---|

## <u>මූල්‍ය චක්‍රලේඛ 02/2023</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

### <u>1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා නිකුත් කර ඇති රාජ්‍ය මුදල් හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ සංගෘහිත කර පරිශීලනයට පහසු ආකාරයට එක් චක්‍රලේඛයක් නිකුත් කිරීම.</u>

භාණ්ඩාගාර ලේකම් විසින් "1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා නිකුත් කර ඇති රාජ්‍ය මුදල් හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ සංගෘහිත කර පරිශීලනයට පහසු ආකාරයට එක් චක්‍රලේඛයක් නිකුත් කිරීම" සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022.12.20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (ii) හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ඒ අනුව ඉහත චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන පහත සංශෝධනයට යටත්ව බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක CSWP/FIN-AP/03/FI/01 හා 2023.02.02 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇත.

03. 2022.12.20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2022 (ii) හි 02 ඡේදයෙහි 5 වන කොටස පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| කරුණ | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් ආකාරය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 5. | රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් සියලුම ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය |
| 5.1 | 2020, 2021 හා 2022 වර්ෂවල දී සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන විවිධ ගාස්තු ඉහළ නැංවීමක් සිදුකර නොමැති සියලුම රාජ්‍ය ආයතන විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම ගාස්තු 20% කින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. | 2020, 2021 හා 2022 වර්ෂවල දී සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන විවිධ ගාස්තු ඉහළ නැංවීමක් සිදුකර නොමැති බස්නාහිර පළාත් සභාවට අයත් සියලුම ආයතන විසින් අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම ගාස්තු 20% කින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

| | | |
|---|---|---|
| 5.2 | **පාර්ලිමේන්තුවේ** සම්මත කර ඇති පනතක් හෝ වෙනත් යම් නීතියකින් ගාස්තු සංශෝධනය පිළබඳව විධිවිධාන සලස්වා ඇති ආයතනවලට එම පනත/නීතිය මඟින් නියම කර ඇති ආකාරයට යෝජිත ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ හැකිය. | **බස්නාහිර පළාත් සභාවේ** සම්මත කර ඇති පනතක් හෝ වෙනත් යම් නීතියකින් ගාස්තු සංශෝධනය පිළබඳව විධිවිධාන සලස්වා ඇති ආයතනවලට එම පනත/නීතිය මඟින් නියම කර ඇති ආකාරයට යෝජිත ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ හැකිය. |
| 5.3 | ඉහත 5.1 පරිදි සිදු කරනු ලබන සංශෝධනය පිළිබඳව 2023-03-31 වන දිනට පෙර ද ඉහත 5.2 පරිදි සිදු කරනු ලබන සංශෝධන පිළිබඳව එම සංශෝධන සිදු කළ පසුව ද නියමිත ආකෘතිපත්‍රය මඟින් **රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව** වෙත වාර්තා කළ යුතු වේ. තව ද, **රාජ්‍ය** ආයතන විසින් 2020,2021 හා 2022 වර්ෂවලදී දැනටමත් කරන ලද ගාස්තු සංශෝධන පිළිබඳව 2023-01-31 දිනට පෙර නියමිත ආකෘති පත්‍රය මඟින් **රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව** වෙත වාර්තා කළ යුතුය. අදාළ ආකෘති පත්‍රය **රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ** වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය. | ඉහත 5.1 පරිදි සිදු කරනු ලබන සංශෝධනය පිළිබඳව 2023-03-31 වන දිනට පෙර ද ඉහත 5.2 පරිදි සිදු කරනු ලබන සංශෝධන පිළිබඳව එම සංශෝධන සිදු කළ පසුව ද නියමිත ආකෘතිපත්‍රය මඟින් **පළාත් භාණ්ඩාගාරය** වෙත වාර්තා කළ යුතු වේ. තව ද, **බස්නාහිර පළාත් සභාවේ** ආයතන විසින් 2020,2021 හා 2022 වර්ෂවලදී දැනටමත් කරන ලද ගාස්තු සංශෝධන පිළිබඳව 2023-01-31 දිනට පෙර නියමිත ආකෘති පත්‍රය මඟින් **පළාත් භාණ්ඩාගාරය** වෙත වාර්තා කළ යුතුය. අදාළ ආකෘති පත්‍රය **(ඇමුණුම 01) බස්නාහිර පළාත් සභාවේ** වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය. |
| 5.4 | **රාජ්‍ය** ආයතන විසින් යම් නව ගාස්තුවක් හඳුන්වා දෙන්නේ නම් එම ආයතන විසින් අදාළ **රේඛීය** අමාත්‍යාංශයේ ගරු **අමාත්‍යවරයා මඟින් ඒ** සඳහා **පාර්ලිමේන්තුවේ** අනුමැතිය ලබා ගත යුතු වේ. | **බස්නාහිර පළාත් සභාවේ** අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් සියලුම ආයතන විසින් යම් නව ගාස්තුවක් හඳුන්වා දෙන්නේ නම් එම ආයතන විසින් **බස්නාහිර පළාත් සභාවේ** අදාළ **අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර ඒ සඳහා බස්නාහිර පළාත් සභාවේ** අනුමැතිය ලබා ගත යුතු වේ. |

04. 2022.12.20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2022 (ii) හි 03 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**" මෙම චක්‍රලේඛය පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2092640 මඟින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)(බ.ප.) ඇමතිය හැකිය."**

05. ඒ අනුව මෙම චක්‍රලේඛය මඟින් සංශෝධිත විධිවිධාන මෙදින සිට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වමි.



ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

The Secretariat, Colombo 01, Sri Lanka

Office | Fax | Website

My No: PFD/RED/REG/CIR/2022/01 Your No: Date: 2022.12.20

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 (ii)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**<u>1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා නිකුත් කර ඇති රාජ්‍ය මුදල් හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ සංගෘහිත කර පරිශීලනයට පහසු ආකාරයට එක් චක්‍රලේඛයක් නිකුත් කිරීම</u>**

2022.12.08 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 2023 වර්ෂය සඳහා වූ අයවැයෙහි අන්තර්ගත යෝජනාවන්හි 35.1 වන යෝජනාව අනුව 2020, 2021 හා 2022 වර්ෂවලදී සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියළුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ සේවාවන් සඳහා දැනට අයකරනු ලබන විවිධ ගාස්තු 2023 ජනවාරි 01 වන දින සිට 20%කින් ඉහළ නැංවීමට තීරණය වී ඇත.

02. ඒ අනුව, 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි II කොටස 5 ඡේදය - **"රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය"** ලෙස ඇති කොටස පහත පරිදි සංශෝධනය කරමින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර 2023 වර්ෂයේ දී රාජ්‍ය ආයතන විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම සඳහා 2023.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන අදාළ කරගත යුතු ය.

**" 5. රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය**

5.1 2020, 2021 හා 2022 වර්ෂවලදී සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන විවිධ ගාස්තු ඉහළ නැංවීමක් සිදු කර නොමැති සියලුම රාජ්‍ය ආයතන විසින් අදාළ විෂය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම ගාස්තු 20%කින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතු ය.

5.2 පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති පනතක් හෝ වෙනත් යම් නීතියකින් ගාස්තු සංශෝධනය පිළිබඳව විධිවිධාන සලස්වා ඇති ආයතනවලට එම පනත/නීතිය මගින් නියම කර ඇති ආකාරයට යෝජිත ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ හැකි ය.

5.3 ඉහත 5.1 පරිදි සිදු කරනු ලබන සංශෝධන පිළිබඳව 2023.03.31 වන දිනට පෙර ද ඉහත 5.2 පරිදි සිදු කරනු ලබන සංශෝධන පිළිබඳව එම සංශෝධන සිදු කළ පසුව ද නියමිත ආකෘතිපත්‍රය මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු වේ. තව ද, රාජ්‍ය ආයතන විසින් 2020, 2021 හා 2022 වර්ෂවලදී දැනටමත් සිදු කරන ලද ගාස්තු සංශෝධන පිළිබඳව 2023.01.31 දිනට පෙර නියමිත ආකෘතිපත්‍රය මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය. අදාළ ආකෘතිපත්‍රය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකි ය.

5.4 රාජ්‍ය ආයතන විසින් යම් නව ගාස්තුවක් හඳුන්වාදෙන්නේ නම් එම ආයතන විසින් අදාළ විෂයය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා මගින් ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වේ.”

03. මෙම චක්‍රලේඛය පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484614 මගින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ඇමතිය හැකි ය.

කේ. එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති

ඇමුණුම 01

**බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ සියලුම ආයතන විසින් සපයනු ලබන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය පිළිබඳ විස්තර දැනුම් දීම සඳහා වන ආකෘති පත්‍රය**

1. අමාත්‍යාංශය :
2. දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම :
3. ගාස්තු අයකිරීමේ අධිකාරය :

   (ගාස්තු අයකිරීමේ අධිකාරය ලැබී ඇතිආකාරය සම්බන්ධ විස්තර ඇමුණුමකින් ඉදිරිපත් කරන්න.)
4. මුල් වරට ගාස්තු අය කරන ලද වර්ෂය :
5. අවසන් වරට ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය :
6. ගාස්තු සංශෝධනය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරනු ලබන්නේ කුමන කාණ්ඩය යටතේ ද යන්න:(මූල්‍ය චක්‍රලේඛ .......................... වගන්තිය යටතේ ගාස්තු සංශෝධන වාර්තා කිරීම/ **2020-2022** වර්ෂයේ ගාස්තු සංශෝධන වාර්තා කිරීම)
7. ගාස්තු සංශෝධනය සම්බන්ධ තොරතුරු **8.1** හා/හෝ **8.2** වගුව මගින් ඉදිරිපත් කරන්න

**8.1 2023** වර්ෂය සඳහා ගාස්තු සංශෝධනය දැනුම් දීම

| I | II | III | IV | V | VI |
|---|---|---|---|---|---|
| අනු අංකය | සපයනු ලබන්නා වූ සේවය | අවසන්වරට ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය | අවසන්වර ට පැවති ගාස්තුව (රු.) | **2023** සංශෝධිත ගාස්තුව (රු.) | එම ආදායම බැර කිරීමට අපේක්ෂිත ආදායම් ශීර්ෂය (බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු) |
| | | | | | |

**8.2 2020-2022** වර්ෂය සඳහා දැනටමත් සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව දැනුම් දීම

| I | II | III | IV | | V | | | VI |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | ගාස්තු සංශෝධනය කරනු ලද වර්ෂය | සපයනු ලබන්නා වූ සේවය | සංශෝධනය කළ ගාස්තුව | | **2020-2022** වර්ෂවල අය කළ මුළු ආදායම (රු) | | | එම ආදායම බැර කිරීමට අපේක්ෂිත ආදායම් ශීර්ෂය (බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු) |
| | | | වටිනාකම සිට දක්වා | % | **2020** | **2021** | **2022** | |
| | | | | | | | | |

.......................................

ආදායම් ගණන්දීමේ නිලධාරී

දිනය:..............................